# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1371 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 24/08/2024 පැය 1215

## මාධ්‍ය නිවේදනය

### අතුරුගිරිය පොලිස් වසමේ වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කිරීමේ අපරාධය සම්බන්ධයෙන් අවශ්‍ය කරන සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය.

2024.07.08 වන දින අතුරුගිරිය පොලිස් වසමේදී වෙඩි තබා පුද්ගලයින් දෙදෙනෙකු ඝාතනය කර සහ සිව් දෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ සිද්ධිය සම්බන්ධව 2024.08.23 වන දින සවස් කාලයේ දෙහිවල පොලිස් වසමේ කවුඩාන ප්‍රදේශයේදී ත්‍රස්ත විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් විසින් මෙම ඝාතනය සිදුකළ බවට සැකකරන වෙඩික්කරුවෙකු සහ ඊට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාර වෙඩික්කරු වයස අවුරුදු 31 ක් වන අහුංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර මොහු හිටපු යුධ හමුදා සෙබළෙකු බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.**

අනෙක් සැකකරුවන් දෙදෙනා අවුරුදු 29 හා 40 වයස් වල පසුවන අහුංගල්ල හා දෙහිවල ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර වයස අවුරුදු 29 ක් වූ සැකකරු මෙම අපරාධය සඳහා අතුරුගිරිය ප්‍රදේශයෙන් නිවසක් කුලියට ගැනීම සහ වෙඩික්කරුවන් බස් රථයකින් කතරගම ප්‍රදේශයට රැගෙන ගිය පුද්ගලයා බවට අනාවරණය වී ඇත.

සැකකරුවන් සන්තකයේ තිබී ටී 56 වර්ගයේ ගිනි අවියක්, බට් එක කපන ලද ෂොට් ගන් අවියක්, ටී 56 පතරොම් ඇතුළු විවිධ වර්ගයේ පතරොම් 283 ක්, ටි.56 පතරොම් ගැබ් 02 ක් පිස්තෝල පතරොම් ගැබ් 02 ක්, අත් විලංගුවක් හා ජංගම දුරකථන 03 ක් ඇතුළු දේපල පොලිස් භාරයට ගෙන ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**